## ශීර්ෂය 256 - ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

---

## 1 මූල්‍ය ප්‍රකාශන

---

### 1.1 විගණන මතය

---

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව සහ විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 26 දින ගණන්දීමේ නිළධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණු බව.

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

## 2.1 වියදම් කළමනාකරණය

---------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ) ඌන ඇස්තමේන්තු පිළියෙල කිරීම**<br>---------------------------------<br>256-1-1-2-2104 වැය විෂය සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ රු.118,600,000 ක මාරුකිරීම් ද පරිපූරක ප්‍රතිපාදන යටතේ රු.350,000,000 ක්ද ලෙස එකතුව රු.468,600,000 ක් අතිරේක ප්‍රතිපාදන සලසාගෙන තිබූ අතර එම ප්‍රමාණය අයවැයගත ප්‍රතිපාදනය වූ රු.400,000,000 න් සියයට 117 ක ප්‍රමාණයක් විය. | වාර්ෂික අයවැය ඇස්තමේන්තු තුල 2104 නව ගොඩනැගිලි ඉදිකිරීම තුල රු.මිලියන 1000 කට ආසන්න ප්‍රතිපාදන වර්ෂය තුල ඉල්ලුම් කරන ලදි. වාර්ෂික ඇස්තමේන්තු තුලින් ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් නොකිරීම නිසා ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු වලට යම් බාධා පැමිණිය හැකි නිසා අමතර ප්‍රතිපාදන පරිපූරක ඇස්තමේන්තු යටතේ වෙන් කර දෙන ලද අතර, ඉතිරි ප්‍රතිපාදන ප්‍රාග්ධන වැය විෂයන් යටතේ ඉතිරිවන්නේ නම් මු.රෙ 66 යටතේ මාරුකර ගන්නා ලෙස දන්වන ලදී. අයවැය සීමාවට බලපෑමක් ඇති නොවන පරිදි හා මුදල් රෙගුලාසි 66 ට අනුව අදාල ප්‍රතිපාදන අමාත්‍යංශ ලේකම්ගේ නිර්දේශ හා අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත මාරු කරන ලදී. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව හැකිතාක් දුරට නිවැරදිවත්, සම්පූර්ණවත් ඇස්තමේන්තු පිළියෙළ කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ආ) අධි ඇස්තමේන්තු සකස් කිරීම**<br>-----------------------------------<br>මූලධන වැය විෂයයන් 4 කට සලසා තිබුණු ප්‍රතිපාදන ඉතිරිවීම හේතුවෙන් මුදල් රෙගුලාසි 66 ප්‍රකාර මාරුකිරීම් යටතේ සියයට 38 සිට සියයට 91 දක්වා වූ ප්‍රමාණයක් වෙනත් වැය විෂයයන්ට මාරුකර තිබුණි. | මෙම ප්‍රතිපාදන වෙන්කරන ලද්දේ Covid - 19 වසංගත තත්වය යටතේ භාණ්ඩ මළු ලබාදීම , එළවළු මිලදී ගැනීම හා Express pearl නෞකා වන්දි ගෙවීමටය. මෙහිදී රු.10,000 භාණ්ඩ මල්ල රු.5,000 දක්වා අඩුවීම, අඩුආදායම් ලාභීන්ට පමණක් ලබාදීම, ඇතැම් ප්‍රතිලාභීන්ට රු.5,000 පමණක් ලබාදීම, එළවළු මිලදී ගැනීම වැඩසටහන නවතාදැමීම සහ Express pearl නෞකා හානිය හේතුවෙන් වන්දි ලාභීන් අදාල වන්දි මුදල් සඳහා සුදුසුකම් නොලැබීම මත ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | හැකිතාක් නිවැරදිව ඇස්තමේන්තු පිළියෙළ කළ යුතුය. |

## 2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේදී විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 51 කින් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ගම්පහ දිස්ත්‍රික් ලේකම්වරයා වෙත වෙන් කර තිබූ රු.7,433,318,046 ක ප්‍රතිපාදනවලින් රු.391,985,651 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. | වර්ෂ අවසානයේ ව්‍යාපෘති සඳහා භාණ්ඩ මිලදී ගැනීමේ ගැටළු හා ක්‍රියාත්මක කිරීමේ ගැටළු, Covid-19 යටතේ ප්‍රතිපාදන ඉතිරිවීම ඇතුළුව අතැති බිල්පත් වටිනාකම වූ මිලියන 70 කට ආසන්න වටිනාකමක් නිරවුල් කිරිමට නොහැකි විම නිසා ප්‍රතිපාදන උපයෝජනය උපරිමකරණය ගැටළු පැන නැඟි ඇත. | අනුමත ප්‍රතිපාදනවලින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | මියගිය බව දැනුම් දීමට ප්‍රමාදවීම, විශ්‍රාම වැටුප් චක්‍රලේඛවලට අනුගත නොවීම සහ වෙනත් හේතූන් මත ගම්පහ දිස්ත්‍රික්කය තුළ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 මඟින් 2021 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් ලබමින් සිටි විශ්‍රාමිකයින් 362 දෙනෙකු සඳහා රු.33,052,527 ක විශ්‍රාම වැටුප් වැඩියෙන් ගෙවා තිබුණි. | මෙම වැඩිපුර ගෙවීම් ක්‍රියාවලිය සම්බන්ධයෙන් කටයුතු කිරීම හා අදාළ ක්‍රියාමාර්ග ගැනීම විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ වගකීමක් වේ. කෙසේ වෙතත් පසුගිය වර්ෂ 10 තුළ ප්‍රධාන ගණකාධිකාරීගේ මෙහෙයවීමෙන් ප්‍රාදේශීය ලේකම්වරුන්ට හා ගණකාධිකාරීවරුන්ට අවශ්‍ය උපදෙස් ලබා දෙමින් මෙම වැඩිපුර ගෙවන ලද මුදල් සැහෙන ප්‍රමාණයක් අයකරගෙන ඇති බව දන්වනු කැමැත්තෙමි. | වැඩිපුර ගෙවීම් ආපසු අය කර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |

## 2.3 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

-----------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| **(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| **(i)** 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 සහ 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008(1) දරන චක්‍රලේඛය | ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල පුරවැසි සේවාලාභි ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය හා ඇගයීම නිලධාරින්ගේ කාර්යසාධනය මගින් සිදු කරනු ලැබේ. | චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුව කටයුතු කල යුතුය. |
| (ii) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | සෑම ඉන්ධන පරීක්ෂාවකට පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර මාණයක් ධාවනය කිරීමෙන් ප්‍ර පසුව හෝ එන්ජිමට සම්බන්ධ ධාන අලුත්වැඩියාවකට පසුව ප්‍ර හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවකට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළයුතු වුවත් ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අදාළ විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂයේ අවසානයේ සිට 2021 වර්ෂයේ මුල් මාස කීපය තුළ දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වාහන ඉන්ධන දහන පරික්ෂාවට යොමු කරන ලදී. එන්ජින් අලුත් වැඩියාව සිදු කරන ලද වාහන<br>වේගවත්ව ධාවනයේ යෙදවිය නොහැකි බව මෝටර් රථ පරික්ෂක විසින් දන්වන ලද අතර, එම වාහන ඉන්ධන පරික්ෂාවට යොමු කිරීමට දිනයන් ලබා දෙන බව ප්‍රධාන මෝටර් රථ පරික්ෂක විසින් දන්වා ඇත. | - එම - |

| | | | |
|---|---|---|---|
| **(ආ)**2017 ජූලි 03 දිනැති අංක 130/09/14/8 දරන ජාතික අයවැය චක්‍රලේඛය | කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරීවරුන් දෙදෙනෙකු සහන පදනම මත යතුරුපැදි ලබාගෙන තිබියදී වයස 60 සම්පූර්ණ වීමට පෙර විශ්‍රාම යාම නිසා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව යතුරුපැදිවල වෙළඳපල වටිනාකම වන රු.273,420 ක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ආපසු ගෙවිය යුතු වුවත් වසර 4 කට වඩා වැඩි කාලයක් ගතවී ඇතත් එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයවියයුතු යතුරුපැදි මුදල වන රු.273,420 ක මුදල, විශ්‍රාම පාරිතෝෂිකයෙන් 2022 ජුනි මසදී අයකර ගැනිමට කටයුතු කරන ලෙස විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත යෝජනා කර ඇත. | - එම - |
| **(ඇ)** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදය 13(3) වගන්තිය | වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරනතෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් වුවද මීගමුව, අත්තනගල්ල සහ මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ග්‍රාම නිලධාරීන් පිළිවෙළින් 07,27 සහ 06 දෙනෙකු මාස 03 සිට මාස 09 දක්වා කාලයක් වැඩ බැලීම් කර තිබුණි. | දැනට සේවයේ නියුතු ග්‍රාම නිලධාරින් විශ්‍රාම ගැනිම, දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරුවීම මත පුරප්පාඩු ඇති වේ. එසේ වුවද 2018 වර්ෂයෙන් පසුව ග්‍රාම නිලධාරි නව බඳවාගැනිම් සිදු නොවිම මත පුරප්පාඩු සම්පූර්ණ වී නොමැත. එබැවින් සේවයේ නියුතු ග්‍රාම නිලධාරින් වැඩ බැලීම සඳහා පත් කර ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) 1647 (ඉ) | මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහන භාර ධාරීන් විසින් තමන් භාරයේ ලනි ඇති මෝටර් වාහන පිළිබඳව ලියාපදිංචි අංකය, වාහනයේ වර්ගය, මෝස්තරය මෙන්ම භාරදුන් හෝ පැවරු දිනය හා ඒ පිළිබඳ විස්තර ද වෙනත් නිසි තොරතුරු ද දැක්වෙන වාහන පිළිබඳ ලැයිස්තුවක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | විගණනය මගින් පෙන්වාදී ඇති කරුණුවලට අනුව ඉදිරියේදී අදාළ වාර්තාව විගණකාධිපතිට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(i)** මු.රෙ 1646 | මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ධාවන සටහන්පත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදාල ධාවන සටහන්පත් විගණනයට ඉදිරිපත් කිරිමට කටයුතු කරන ලෙස දන්වා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.4 වංචනික ස්වරූපයේ ගනුදෙණු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ 2014 ජුලි 15 දින සිදු වූ සේප්පුවේ මුදල් අතුරුදහන් වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(1)(ආ) ප්‍රකාරව පැවති අවසන් පරීක්ෂණ වාර්තාව අනුව ප්‍රාදේශිය ලේකම්, ගණකාධිකාරි, මුදල් සහකාර සහ සරප් යන නිලධාරින්ගෙන් සමානව රු.270,561 බැගින් අයකර ගත යුතු බවට නිර්දේශ කර තිබුණි. ඒ අනුව 2020 සැප්තැම්බර් 22 දිනැති ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියෙන් අය කිරීම සඳහා නිර්දේශ හා අනුමැතිය ලබා දී තිබුණ ද අදාළ අයකිරීම් සිදුකර නොතිබුණි. මෙම අලාභ මුදල ගෙවීම සඳහා නිලධාරීන් සිව් දෙනාම අකමැත්ත ප්‍රකාශකර ඇති බැවින් මෙම අලාභය පිළිබඳ පරික්ෂා කිරීම සඳහා ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය මත දිස්ත්‍රික් ලේකම්වරයා විසින් 2022 අප්‍රේල් මාසයේදී නව පරීක්ෂණ මණ්ඩලයක් පත්කර තිබුණි.මේ හේතුව නිසා පරීක්ෂණය සඳහා වැයකරන ලද මුදල නිශ්ක්‍රීයව තිබුනු අතර නැවත පරීක්ෂණ මණ්ඩල ගාස්තු ගෙවීමට සිදුවී තිබුණි. | 2014 ජුලි 14 දින මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මුදල් අතුරුදහන් වීම සම්බන්ධයෙන් පවත්වන ලද පරීක්ෂණ වාර්තාවට අනුව වගකිව යුතු නිලධාරීන් හතර දෙනාගෙන්ම මධ්‍යම රජයට සිදුවූ අලාභය සම්බන්ධයෙන් රු.32,247.14 බැගින් අයකරගැනීම සඳහා 2021 නොවැම්බර් 01 දිනැතිව ලිපි මගින් ඔවුන්ට දැනුම්දී ඇත. නැවත ඉහත සමාංක හා 2021 දෙසැම්බර් 14 දිනැතිව බස්නාහිර පළාත් සභාවට අයවිය යුතු අලාභය වෙනුවෙන් රු.228,946.50 බැගින් ගෙවන ලෙස ඔවුන්ට දැනුම්දී ඇත. නමුත් අදාළ වගකිව යුතු නිලධාරීන් සියලුදෙනාම අලාභය හානි පූර්ණය කිරීම සඳහා කිසිදු එකගතාවක් නොමැති බැවින් ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක F/DA/06/WRI02/003 හා 2022 පෙබරවාරි 10 දිනැති ලිපියට අනුව නව පරීක්ෂණ මණ්ඩලයක් මගින් මු.රෙ.104 (1)(ආ) ප්‍රකාරව නැවත පරීක්ෂණයක් පැවැත්වීමට මණ්ඩලය නම්කර අනුමැතිය සඳහා 2022 මාර්තු 22 දිනැතිව ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙතට ඉදිරිපත් කර ඇත.අමාත්‍යාංශ ලේකම් විසින් නව පරීක්ෂණ මණ්ඩලය පත්කිරීමට ලබාදුන් අනුමැතිය මත දිලේ/P/1/16 හා 2022 අප්‍රේල් 08 දිනැතිව නව පරීක්ෂණ මණ්ඩලයට දන්වා ඇත. තවද මාස 03 ඇතුලත වාර්තාව ලබාදෙන ලෙස දන්වා ඇත. | පරීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව අයකිරීමට කටයුතු කළ යුතු අතර, අයකිරීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය.නව පරීක්ෂණ මණ්ඩලයක් පත්කිරීමට කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2.5 අත්තිකාරම් නිකුත්කිරීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මිය ගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ හා සේවය හැර ගිය නිලධාරීන්ගෙන් 2021 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.3,946,286 ක් විය. එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක | මෙම ණය ශේෂ අයකර ගැනීම සඳහා නිරන්තරයෙන් පසු විපරම් කරමින් කටයුතු කර ඇත. බොහෝ ණය අදාල ණයලාභීන්ගේ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනීම සඳහා තීරණය කර ඇති අතර ඒ සඳහා අදාල ක්‍රියාමාර්ග ගෙන ඇත . | මුදල් රෙගුලාසි 371 සහ චක්‍රලේඛ විධිවිධාන වලට අනුව ණයශේෂ නොපමාව අයකර |

| | | | |
|---|---|---|---|
| | සිට වර්ෂ 5 ට වැඩි කාල පරාසයක සිට පැවත එමින් තිබුණද එම ශේෂ අයකර ගැනීම හා පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි. | අනෙකුත් ශේෂ හැකිතාක් දුරට 2022 නොවැම්බර් 30 දින වන විට අයකර ගැනීමට බලාපොරොත්තු වේ. | ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 371(2)(ඇ) අනුව අතුරු අග්‍රිමයන් දීම හුදෙක් මාණ්ඩලික තත්වයේ නිලධාරීන්ට පමණක් සීමා විය යුතු වුවද , 2021 වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, සහ මීරිගම හා මීගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාල මගින් මාණ්ඩලික නොවන නිලධාරීන් සඳහා අවස්ථා 81 කදී රු.1,089,288 ක් අත්තිකාරම් ලෙස ලබා දී තිබුණි. | තත්කාර්ය අතුරු අග්‍රිම විවිධ ව්‍යාපෘති සඳහා ගෙවීමට සිදුවන අවස්ථා උදාවන අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුළ මෙම අත්තිකාරම් ලබාගැනීම සඳහා සීමිත මාණ්ඩලික නිලධාරීන් පිරිසක් සිටින නිසා කළ නොහැක. ඒ් අනුව අදාල වැඩසටහන සඳහා ඇස්තමේන්තුවක් සකස්කර මාගේ අනුමැතිය සහිතව අදාල විෂය භාර තාක්ෂණ නිලධාරියාට අත්තිකාරම් මුදල ලබාදෙනු ලැබේ. | මුදල් රෙගුලාසි වලට අනුව මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් අතුරු අග්‍රිම ලබාදිය යුතුය. |
| (ඇ) | මුදල් රෙගුලාසි 371(ආ) සහ 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව එක් වරකට ලබාදිය හැකි තත්කාර්ය අතුරු අග්‍රිම සීමාව රු.100,000 වුවද 2021 වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් අවස්ථා 08 කදී රු.100,000 ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම නිදහස් කර තිබුණි. | අදාළ අවස්ථා 8 දී මෙම තත්කාර්ය අතුරු අග්‍රිමය හදිසි ආපදා තත්වය මත නිදහස්කර ඇත. තවද කොරෝනා තත්වය නිසා වෙළඳසැල් හිමියන් ණය පදනම මත භාණ්ඩ ලබා දීමට කැමති නොවීම නිසා මෙම නිලධාරීන්ට අත්තිකාරම් ලබා දී ඇත. ඉතා ඉක්මනින් අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි 371 සහ චක්‍රලේඛ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුය. |

**2.6 තැන්පත් ශේෂයන්**

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවා ගන්නා ලද කොන්ත්‍රාත් රැඳවුම් තැන්පතු ගිණුම් අවස්ථා 361 ක් ඇතුළුව අවස්ථා 362 කදී තැන්පත් කරන ලද, වර්ෂ දෙකකට වඩා කල් ඉකුත් වූ වටිනාකම රු.25,979,753 ක් වූ ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රදවා ගන්නා ලද කොන්ත්‍රාත් රදවා ගැනීමේ තැන්පතු (වසර 2 ට වැඩි) හැකිතාක් දුරට 2021 දෙසැම්බර් 31 වන විට නිරවුල් කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදී . | කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව නිමකර තිබේ නම් සහ වගකීම් කාල සීමාව නිම වී තිබේ නම් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව තැන්පත් මුදල් අදාල ගිණුමට හෝ රජයේ ආදායමට බැර කළයුතුය. |
| (ආ) ඉඩම් තැන්පතු ගිණුමේ අවස්ථා 77 කට අදාල රු.86,883,880 ක් වූ වර්ෂ 10 ක් ඉක්ම වූ ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පසුගිය වසර 10 තුලම ඉඩම් තැන්පතු නිරවුල් කිරීම සඳහා අවශ්‍යය උපදෙස් ලබා දී ඇති අතර ප්‍රාදේශීය ලේකම්වරුන් දැඩි උත්සහයක් ගෙන ඇත. අදාළ වන්දි ගෙවීම සඳහා එම දේපලවල නිරවුල් භාවය හා වන්දි ඉඩම්හිමියන් ලබාගැනීම ප්‍රතික්ෂේප කිරිම හා වර්ෂ අවසානයේ අක්මුදල් ප්‍රමාණවත් නොවිම නිසා නිරවුල් කිරීමේ ගැටළු පැන නැඟුනි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.7** **බැංකු ගිණුම් මෙහෙයවීම**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මිනුවන්ගොඩ, අත්තනගල්ල සහ මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශවලට අයත් දිවිනැගුම ප්‍රජා මූල බැංකු 16 ක් පවතින අතර එම බැංකු මගින් විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබූ ණය මුදල්වලින් 2021 දෙසැම්බර් 31 දිනට රු.254,159,657 ක ණය ගෙවීම් පැහැර හැරීම් නිරීක්ෂණය විය. | කොරෝනා වසංගත තත්වය හේතුවෙන් ණය ලාභීන්ගේ ආදායම් මාර්ග අවහිර වීම නිසා ණය පැහැර හැරීම් වැඩි වී ඇත. මෙම තත්වය දිවයිනේම සමාන බැවින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ණය ගෙවීම සඳහා සහන කාලයක් ලබා දී ඇත. එම ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහනක්ද මේ වනවිට ක්‍රියාත්මක කරමින් පවතී. තවද සමෘද්ධි බැංකුව විසින් මෙම කල්පසු වූ ණය නැවත අයකර ගනිමින් පවතී. | ණය අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ආ) එක් ග්‍රාම නිළධාරී වසමකට එක් ග්‍රාමීය කර්මාන්ත ව්‍යවසායකයෙක් බිහි කිරීමේ වැඩසටහන යටතේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රතිලාභීන්ට ලබා දීම සඳහා යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීමට රු.3,262,082 ක් වූ චෙක්පත් 08 ක් ලියා තිබුණි. 2022 පෙබරවාරි 07 දින වන විටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත භාණ්ඩ ලැබී නොතිබුණු අතර විෂයය භාර නිළධාරියා විසින් එම චෙක්පත් නිකුත් නොකර ළඟ තබා ගෙන තිබුණි. මුදල් රෙගුලාසි 386(4) ප්‍රකාරව චෙක්පත්වල වලංගු කාල සීමාවද ඉක්මවා තිබුණි. | රටේ පවතින ආර්ථික අර්බුදය නිසා මෙම තත්වය ඇති වී ඇත. මේවන විට චෙක්පත් 4 ක් අදාල ආයතන වෙත ලබා දි ඇති අතර ඉතිරි චෙක්පත් හතර වන රු.1,260,000 , රු.436,450 ,රු.98,794 හා රු.110,000 නිලධාරියා භාරයේ ඇත. කඩිනමින් එම චෙක්පත් අදාල සමාගම් වෙත ලබාදීමට කටයුතු කරමි. | භාණ්ඩ ලැබීමෙන් පසුව පමණක් චෙක්පත් ලිවිය යුතුය. |

**2.8 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව විගණන පරික්ෂාවට ලක් කරන ලද මීරිගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ඇති වාහනවල වර්ගය, ලියාපදිංචි අංකය, පවරණ ලද දිනය, හුවමාරු කළ දිනය හා වෙනත් වැදගත් තොරතුරු ඇතුළත්ව පිළියෙළ කළ යුතු වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. | වාහන ලැයිස්තු ගත කිරීමේ ලේඛනයක් නඩත්තු කර නොතිබූ අතර , ඉදිරියේ දී කාර්යාලයේ වාහන දෙක සඳහා අදාල කිරීමට කටයුතු කරන ලේඛන නඩත්තු ලෙස දන්වා ඇත | මුදල් රෙගුලාසි කාරව වාහන ප්‍ර තොරතුරු ඇතුලත් ලේඛනයක් පවත්වාගෙන යා යුතුය. |
| (ආ) | මීරිගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් මුදල් රෙගුලාසි 1647(ඇ) ප්‍රකාරව පවත්වාගෙන යා යුතු ඉන්ධන පරිභෝජන තොග ලේඛණයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉන්ධන පරිභෝජන තොග ලේඛනයක් පවත්වාගෙන නොයන අතරඑසේ , වුවද ඉන්ධන නිකුත් කිරීමේ ලේඛනය නිසි එමගින් ,පරිදි නඩත්තු කරගෙන යන බැවින් පාලනය ඉන්ධන නිකුත් කිරීම නිසි පරිදි කරනු ලැබේ.තවද වාහනවල ධාවන සටහන් දිනපතා යාවත්කාලීන කර නඩත්තු කෙරෙන බැවින් ඉන්ධන පරිභෝජනය එමගින් පාලනය වේ. | - එම - |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටුනොකිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 අප්‍රේල් 27 දිනැති අංක HAF 3-ADMIN 04-002 දරන ස්වදේශ කටයුතු අමාත්‍යංශ ලේකම්ගේ ලිපිය ප්‍රකාරව එක් ග්‍රාම නිලධාරී කාර්යාලයක් වර්ෂයකට අවම වශයෙන් තුන් වරක්වත් පරිපාලන ග්‍රාම නිලධාරී විසින් පරීක්ෂා කළ යුතු වුවත්, මිනුවන්ගොඩ, අත්තනගල්ල සහ මීගමුව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල | එම වකවානුව තුළ පැවති කොවිඩ් වසංගත තත්වය මත කාර්යාල පරීක්ෂාවේ නියමිත ඉලක්කය සපුරා ගත නොහැකිවූ අතර මෙම වර්ෂයේදී එම කටයුතු නියමාකාරයෙන් ඉටුකිරීමට කටයුතු කරන බවද | ප්‍රමාණවත් ග්‍රාම නිලධාරී කාර්යාල ප්‍රමාණයක් පරීක්ෂා කළ යුතුය. |

| | |
|---|---|
| ප්‍රදේශවලට අයත් ග්‍රාම නිලධාරී වසම් පිළිවෙලින් 121 ක්, 151 ක් සහ 39 ක් අතරින් පිලිවෙලින් 61 ක්, 94 ක් සහ 13 ක් එක් වතාවක්වත් පරික්ෂා කර නොතිබුණි . | කාරුණිකව දන්වා සිටිමි. |

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ප්‍රතිපාදන යටතේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉදිකිරීම් ව්‍යාපෘති 188 ක් සඳහා රු.117,500,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. සැලසුම් කර තිබූ ඉදිකිරීම් 188 න් 11 ක් පමණක් සියයට 100 ක් සම්පූර්ණ කර තිබූ අතර ඉදිකිරීම් 126 ක් සියයට 25 ක් සම්පූර්ණ කර තිබුණි. ඉදිකිරීම් 36 ක් සඳහා ඇස්තමේන්තු සකස් කර ලංසු ලේඛන පිළියෙල කර තිබුණි. ව්‍යාපෘති 15 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. මේ අනුව ව්‍යාපෘති 188 සඳහා සමස්ත ඇස්තමේන්තුව වූ රු.106,650,000 න් රු.68,270,726 ක් සඳහා කොන්ත්‍රාත් පිරිනමා තිබූ අතර මූල්‍ය ප්‍රගතිය රු.976,898 ක් විය. එනම් කොන්ත්‍රාත් ප්‍රතිපාදන භාවිතය සියයට 0.83 ක් ද කොන්ත්‍රාත් වටිනාකමින් මූල්‍ය ප්‍රගතිය සියයට 1.43 ක් වැනි අඩු මට්ටමකද පැවතුණි. මේ අනුව රජය වාර්ෂිකව ලබා දෙන ප්‍රතිපාදන නිසිපරිදි උපයෝජනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය . | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ගැටළු හා අක්මුදල් නොලැබීම හා භාණ්ඩ මිල ඉහල යාම, කොන්ත්‍රාත්කරුවන් හා සැපයුම්කරුවන් ව්‍යාපෘති කටයුතු හා සැපයුම් කටයුතු සඳහා ඉදිරිපත් නොවීම ආදී හේතු නිසා ව්‍යාපෘතිවල ප්‍රගතිය අඩු වී ඇත. | ප්‍රතිපාදන නිසිපරිදි උපයෝජනය කළ යුතුය. |

### 3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (outcome) ලබා නොගැනීම.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 ජූනි 16 දිනැති අංක 03/2021 දරන වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛය සහ 2021 ජූලි 15 දිනැති SMRIP/DEV/(V)/10/03/2021/ (පොදු) දරන ලිපිය ප්‍රකාරව එක් ග්‍රාමනිලධාරී වසමකට එක් ග්‍රාමීය කර්මාන්ත ව්‍යවසායකයෙක් බිහිකිරීමේ වැඩසටහන සඳහා ප්‍රතිලාභීන් තෝරාගැනීමේදී ආහාර අලෙවිසැල්, දෛනිකව ආහාර සපයන ස්ථාන, වෙළඳසැල්, බිම්මල් වගාව, විසිතුරු මල් වගාව, ඇඟළුම් කර්මාන්තය ආශ්‍රිත මැෂින්, ගෑස් ලිප්, බ්ලෙන්ඩර් වැනි ගෘහ උපකරණ ලබා දීමට අදාළ ප්‍රතිලාභීන් තෝරා නොගත යුතුබව දන්වා තිබුණි.නමුත්, ඊට පටහැනිව මීගමුව, මිනුවන්ගොඩ සහ මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එවැනි ප්‍රතිලාභීන් 102 දෙනෙකු වෙනුවෙන් රු.7,780,985 ක් වටිනා උපකරණ ලබා දී තිබුණි. | අදාල චක්‍රලේඛ උපදෙස් අනුව තෝරා ගන්නා ලද ස්වයංරැකියා ලාභීන්ට අදාල උපකරණ ලබා දී ඇත. කෙසේ වෙතත් මේ පිළිබඳව ක්ෂසවිස්තර වාර්තාවක් අධ්‍ය සැලසුම් ගෙන් කැඳවා ඇති අතර ලද වහාම ඔබ වෙත ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව ව්‍යාපෘති අරමුණ සඳහා සුදුසුකම් ලබන ප්‍රතිලාභීන් සඳහා පමණක් උපකරණ ලබා දියයුතුය. |

### 3.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. | නිර්දේශය |
|---|---|---|
| (අ) මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මිනුවන්ගොඩ නාලන්දා පිරිමි පාසලෙහි නල ළිඳක් ඉදිකර ජල පොම්පාගාරයක් සවිකර පානීය ජලය ලබා දීම සඳහා රු.1,000,000 ක | මෙම ජල ව්‍යාපෘතිය පිළිබඳ සවිස්තර වාර්තාවක් ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් ඉල්ලුම්කර ඇති අතර එය ලද වහාම ඔබ වෙත ඉදිරිපත් | ලැබෙන ප්‍රතිපාදන මගින් මහජනයාට උපරිම සේවයක් ලැබෙන පරිදි ව්‍යාපෘති නිමකිරීමට කටයුතු |

| | | |
|---|---|---|
| ඇස්තමේන්තුගත මුදලකට 2020 වර්ෂයේ දී ව්‍යාපෘතියක් ආරම්භ කර රු.800,714 ක වියදමක් දැරීමෙන් පසු අපේක්ෂිත ප්‍රතිලාභ ඉටු නොවීම මත ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. | කිරීමට බලාපොරොත්තු වේ . | කළ යුතු බව |
| (ආ) 2021 වර්ෂයේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ විමධ්‍යගත අයවැය යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබුණු රු.950,000 ක ව්‍යාපෘති 05 ක් යාත්මකක්‍රි ණිබුකර නොති. වෙළඳපලේ අමුද්‍රව්‍ය හිඟවීම හා මිල ගණන් ඉහල යාම හේතුවෙන් අදාල කොන්ත්‍රාත්කරුවන් විසින් මෙම ව්‍යාපෘති 05 ක්‍රියාත්මක කිරීමට නොහැකි බව දන්වා තිබුණි. | වෙළඳපලේ අමුද්‍රව්‍ය හිඟවීම මත හා මිල ගණන් ඉහල යාම හේතුවෙන් අදාල කොන්ත්‍රාත්කරුවන් විසින් මෙම ව්‍යාපෘති යාත්මක ක්‍රි 05 කිරීමටනොහැකි බව දන්වා ඇත . | ලැබෙන ප්‍රතිපාදන මගින් මහජනයාට උපරිම සේවයක් ලැබෙන පරිදි ව්‍යාපෘති නිමකිරීමට කටයුතු කළ යුතු බව |

**3.5 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) ජා - ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනට පවතින ගොඩනැගිල්ල ඉතාම අබලන් තත්වයේ පවතින බැවින් නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම 2013 වර්ෂයේදී ආරම්භ කර රුපියල් මිලියන 165.34 ක ඇස්තමේන්තු මුදලකට හැකි ඉක්මනින් ඉදිකර අවසන් කිරීමට බලාපොරොත්තු වී තිබුණි. නමුත් ඉඩම පිළිබඳ මතුවූ ගැටළුකාරී තත්වයන් හේතුවෙන් සිදු වූ කාල පමාවකින් පසු පාදම ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා රු.5,369,779 ක අත්තිකාරම් මුදලක්ද ගෙවීමෙන් පසු කොන්ත්‍රාත්තුවේ වැඩ තාවකාලිකව අත්හිටුවා තිබුණි. පසුව වසරකට ආසන්න කාලයකින් පසු එම ආයතනය මගින්ම රුපියල් මිලියන 27 ක් දරා පාදම කොටස ඉදිකර රුපියල් මිලියන 145.33 වටිනාකමකට ඉතිරි වැඩ කොටස වෙනත් ආයතනයකට පවරා තිබුණි. 2013 වර්ෂයේ දී ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය 2021 නොවැම්බර් 18 දින අවසන් කිරීමට නියමිත වුවත් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට ද නිමකර ගැනීමට හැකි වී නොතිබුණි. | ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු මිලියන145.33 ක මුදලකට සිංහ රුවන් කන්ස්ට්‍රක්ෂන් ආයතනයට පිරිනමන ලද ව්‍යාපෘතියේ කටයුතු මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී .<br><br>ලංකාවේ වැඩිම කාලයක් ඇදිරි ශ්‍රී යාත්මක වූ ගම්පහ නීතිය ක්‍රි ක්කයේදිස්ත්‍රිCOVID - 19 දෙවන රල්ල හේතුවෙන් ඉදිකිරීම් කටයුතු වලට වරින් වර බාධා සිදු වී ඇතත් දැනට ඉදිකිරීම් ප්‍රගතිය සියයට 85 ක සතුටුදායක තත්වයේ පවතී. | ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘතිය නිමකිරීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2021 වර්ෂය අවසන් වන විට වැඩ අවසන්ව භාවිතයට ගනු ලබන නිල සෙවන කාර්යාල 19 ක් ද අත්තිවාරම පමණක් දමා ඇති නිල සෙවන කාර්යාල 7 ක් ද පැවතුණු අතර භාවිතයට ගනු ලබන නිල සෙවන කාර්යාලයන්හි ද ප්‍රමාණවත් පහසුකම් නොමැති බව නිරීක්ෂණය විය. | නිල සෙවන කාර්යාල සඳහා කාර්යාල සැලැස්ම හා ප්‍රතිපාදන වෙන් කෙරෙනුයේ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙනි ඒ . අනුව එම කාර්යාල ඉදිකර ඇත.තවද රටේ පැවති covid 19 වසංගත රෝගී වාතාවරණය හේතුවෙන් අමාත්‍යාංශය මගින් ප්‍රතිපාදන නොලැබීම මත ඇතැම් නිල සෙවන කාර්යාල ඉදිකිරීම අතරමග නැවතී ඇත. | මහජන සේවාවක් උපරිම ආකාරයෙන් කළ හැකි වන ආකාරයට නිලධාරීන්ට අදාළ කාර්යාල පහසුකම් ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා මහල් පහකින් යුත් ගොඩනැඟිල්ලක් ඉදි කිරීමට 2013 ඔක්තෝම්බර් 03 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී රුපියල් මිලියන 167.9 ක් වන මුළු පිරිවැය ඇස්තමේන්තුවට අනුමැතිය ලැබී ඇත. පළමු අදියර ලෙස පයිලින් වැඩ සිදු කර දෙවන අදියර වශයෙන් ගොඩනැඟිල්ල ඉදිකිරීමට තීරණය විය. දෙවන අදියර සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමෙන් අනතුරුව පුද්ගලික සමාගමක් වෙත රු. 110,999,052 ක වැට් රහිත මුදලකට 2016 දෙසැම්බර් 29 දින කොන්ත්‍රාත්තුව පිරිනමන ලදී. මෙම කොන්ත්‍රාත්තුව 2017 ජනවාරි 12 දින ආරම්භ කර දින 350 කින් හෙවත් 2017 දෙසැම්බර් 28 දින වනවිට අවසන් කළ යුතු විය. නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටද ගොඩනැගිල්ල භාවිතයට ගතහැකි තත්වයට පත් කර නොතිබුණි. | පලමුව ටෙන්ඩරය පිරිනැමූ ට්‍රියෝ කන්ස්ට්‍රක්ෂන් ආයතනය රු24,049,996 .ක වැඩ නිමකිරීමෙන් පසු ඍතියවාා අතහැර දැමීමෙන් පසු ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු මිලියන1ක මුදලකට 35.94 තිලක ඉංජිනියරින් පුද්ගලික පිරිනමන ලද ටසමාගම ඍතියේ කටයුතු මේ වන විට වාා ශ්‍රි යාත්මක වෙමින් පවතීක්‍රි වැඩිම කාලයක් ඇදිරි ලංකාවේ යාත්මක වූ ගම්පහ රිනීතිය ක් ක්කදිස්ත්‍රිCovid- 19 දෙවන රැල්ල හේතුවෙන් ඉදිකිරීම් කටයුතු වලට වරින් වර බාධා සිදු වී ඇතත් දැනට ඉදිකිරීම් ප්‍රගතිය සියයට 85 සතුටුදායක තත්වයේ පවතී. | ගිවිසුම් ගත කාලය තුල ව්‍යාපෘති නිම කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.6 ප්‍රසම්පාදනය

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 අප්‍රේල් 21 දිනැතිව සම්පාදන සංශෝධනය වී තිබුණු ප්‍ර මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3.1(ආ) ප්‍රකාරව රු.500,000 ට වැඩි අලුත්වැඩියා කිරීම් සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු බව දක්වා ඇතත් 2021 වර්ෂයේ දී අංක 56-6456 දරන කැබ් රථය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් නියෝජිත ආයතනයට රු.746,070 ක් ගෙවා තිබුණද ඒ් සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අලුත්වැඩියාවට සිදු කරන ලද්දේ දේශීය නියෝජිත ආයතනයෙන් නොවන අතර, ප්‍රාදේශීය ගරාජයකින් අලුත්වැඩියාව සිදු කිරීමේ දී ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව කටයුතු කල හැකි බැවින් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට යොමු නොකරන ලදී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය මගින් පනවා ඇති නීති රීති වලට අනුකූලව කටයුතු කළ යුතු බව. |

## 3.7 වත්කම් කළමණාකරණය

----------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 වර්ෂයේදී ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ විමධ්‍යගත අයවැයෙන් වෙන් කරන ලද රු.ලක්ෂ 50 ක මුදලකට කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ඉදිකිරීම් කටයුතු සිදු කරන ලද දිප්පිටිගොඩ සේවා පියස කාර්යාලය, බහුකාර්ය ගොඩනැගිල්ලක් ලෙස ඉදිකර තිබුණි. එම ගොඩනැගිල්ලෙහි ග්‍රාම නිලධාරී, සංවර්ධන නිලධාරී, සමෘද්ධි නිලධාරී සහ කෘෂි නිලධාරී යන සියලු නිලධාරීන් රාජකාරී කටයුතු කළ යුතුවිය. නමුත් ගොඩනැගිල්ල ඉදිකර වසර 02 කට වඩා වැඩි කාලයක් උවද ප්‍රාදේශීය සභාවට අයිති භූමියක ඉදි කිරීම නිසා ඉහත කී නිලධාරීන්ට එම සේවා පියසෙහි රාජකාරී කටයුතු කිරීමට ප්‍රාදේශීය සභාව විසින් ඉඩ ලබාදී නොතිබුණි. | අදාල ගොඩනැගිල්ලේ පහත මාලය සේවා පියස කාර්යාලය පවත්වාගෙන යාම සඳහා ලබා දෙන බව ප්‍රාදේශීය සභාව විසින් පවසා ඇත. | ගොඩනැගිලි ඉදිකිරීමට ප්‍රථම අයිතිය සහ භාවිතය පිළිබඳ ගැටළු ඇති නොවන ආකාරයට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේහි ආපදා අංශය සතු ට්‍රැක්ටරය හා බවුසරය 2017 වර්ෂයෙන් පසුව එනම් වර්ෂ 04 ක පමණ කාලයක සිට නිශ්ක්‍රීයව පැවතුණි. | අදාල ට්‍රැක්ටරය හා බවුසරය 2020 වර්ෂයේ නියඟ තා අවස්ථාවේ සේවා අවශ්‍යා සඳහා යොදාගෙන ඇති බව දන්වමි. | වත්කම්වලින් උපරිම ප්‍රයෝජන ගතයුතු ය. |

## 3.8 දේපළ පිරියත සහ උපකරණ

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ------------------------------------ | ------------ |
| (අ) | මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටි හෙක්ටයාර් 0.1744 ක් සහිත ඉඩම සඳහා ඔප්පුවක් නොමැතිවීම හේතුවෙන් එහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණු අතර කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල පිහිටි භූමිය රු. 15,000,000 කට තක්සේරු කර ගිණුම්ගත කර තිබුණද එම ඉඩමෙහි අයිතිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් වී තිබුණි. | මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමිය වර්ෂ කිහිපයක සිට තක්සේරු කරන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවට හා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට දැනුම් දුන්නද මේ දක්වා අවශ්‍ය කටයුතු සිදුකර නොමැති අතර ඔප්පුවක් නොමැතිකම නිසා සිදුකල නොහැකි බව තක්සේරු දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇත. මෙම වර්ෂය අවසන් වනවිට මෙම ඉඩම තක්සේරුකර ගිණුම්ගත උත්සාහයක් දරා කිරීමට සැම ඇත.කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ භූමිය , ඉඩම් තිසංස්කරණ කොමිෂන් සභාවට ප්‍ර අයත් වුවත් අනුලේඛණ වල කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැවරී ඇති බවට තොරතුරු සටහන් කර ඇත . | ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් ඇති ගැටළු පිළිබඳව පරීක්ෂා කර ඒවා නිවැරදි කර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් හෝ ප්‍රාදේශීය ලේකම් බලධාරීත්වය යටතේ ඉදිකරන ලද දිවුලපිටිය, වත්තල, කටාන, ගම්පහ, අත්තනගල්ල, ජා ඇල සහ දොම්පෙ යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් සේවා පියස / | ගොඩනැගිලි තක්සේරු කිරීමේදී එම ඉඩම්වල අයිතිය පිළිබඳ ගැටළු නිසා තක්සේරු කිරීමට නොහැකි වී ඇත . මෙම ඉඩම් වලින් දේශීය බොහොමයක් ඉඩම් ප්‍රා රු සභාව සතුවීම නිසා තක්සේ කිරීමට නොහැකි වී ඇති බව | ඉඩම් නිරවුල් අයිතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පවරාගෙන එම ඉඩම් සහ ගොඩනැගිලි වටිනාකම ගිණුම් |

| | | |
|---|---|---|
| නිල සෙවන කාර්යාල 96 ක ගොඩනැගිලි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | දන්වමි.ක් ලේකම් සතුව දිස්ත්‍රි නොමැති ජංගම නොවන වත්කම් ගිණුම්ගත කිරීම ගැටළු සහගත වන බැවින් මේ පිළිබඳව භාණ්ඩාගාර ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් සමඟ සාකච්ඡාකර නිසි වැඩ පිළිවෙළක් යෙදීමට කටයුතු කරමි. | ගතකළ යුතුය. |

**3.9 පාඩු හා හානි**

--------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ)** මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයත් 1999 ජූලි මස සිදු වූ අනතුර සම්බන්ධයෙන් රක්ෂණයෙන් අයකර ගත නොහැකි අලාභය රු.189,360 ක් විය. ඒ සඳහා සිදුකරන ලද ප්‍රාරම්භක වාර්තාවේ නිර්දේශ අනුව අනතුර සිදු කළ වෑන් රථයේ රියදුරු මේ සඳහා වගකිව යුතු විය. ඒ අනුව අදාළ රියදුරුට එරෙහිව නෛතික කටයුතු ආරම්භ කර ඇතත් 2021 දෙසැම්බර් 31 දින වන විට වසර 23 කට ආසන්න කාලයක් ගතවී ඇතත් එම නඩුවෙහි ඉදිරි කටයුතු සිදු නොවීම නිසා අදාළ අලාභය අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි . | මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය **251-3437** වාහනයට සිදුවූ අනතුර සම්බන්ධයෙන් ජොෂ්ඨ සහකාර රාජ්‍ය නීතිඥ රිස්නි පිර්දව්ස් මිය හමු වී තොරතුරු ලබාගන්නා ලෙසත්**,** නඩුවේ ප්‍රගතිය සම්බන්ධයෙන් අදාල පාර්ශ්වයන්ගෙන් විමසා වාර්තා කරන ලෙස දන්වා ඇත. | පරීක්ෂණ ඉක්මනින් කර අදාළ අලාභය අයකරගත යුතුය. |
| **(ආ)** 2021 ඔක්තෝබර් මස 20 දින ගම්පහ දිස්ත්‍රික් මෝටර් රථ කාර්යාලයට අයත් සංඥා කුළුන කඩා වැටීම නිසා මුදල් රෙගුලාසි 104(4) යටතේ සිදුකරන ලද අලාභයන් පිළිබඳ පරීක්ෂණ අවසන් වාර්තාව අනුව සැලසුම් අංශ ගොඩනැගිල්ලට හා එහි උපකරණවලට සිදුවී තිබූ අලාභය රු.861,938 ක් විය. මුදල් රෙගුලාසි 104(1)(ආ) ප්‍රකාර විධිමත් පරීක්ෂණයක් පැවැත්වීම සඳහා කමිටුවක් පත් කිරීම ගම්පහ දිස්ත්‍රික් ලේකම් විසින් නිර්දේශ කර තිබුණු අතර අදාළ කටයුතු පමාවීම හේතුවෙන් මෙම අලාභය අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි . | සංඥා කුළුණ කඩා වැටීම සම්බන්ධයෙන් පත්කර ඇති කමිටුව මගින් අදාල කටයුතු කඩිනම් කර අවසන් කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ. | විධිමත් පරීක්ෂණ කටයුතු ඉක්මනින් අවසන් කර අදාල අලාභය අයකළ යුතුය. |

**3.10 කළමණාකරණ දුර්වලතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලප්‍රදේශයේ පවුල්වලින් අනවසර නිවාසවල ජීවත් වන පවුල් 399 ක් ද තාවකාලික නිවාස 318 ක් ද, වැසිකිලි පහසුකම් නොමැති පවුල් 345 ක් ද, මාර්ග පහසුකම් නොමැති පවුල් 269 ක් ද, පිරිිසිදු ජලය නොමැති පවුල් 662 ක් ද , විදුලිය නැති නිවාස 564 ක් ද, වැඩ කළ හැකි වයසේ පසුවන 27,118 ක් සේවා වියුක්තව සිටින අතර අවම පහසුකම්වත් නොමැතිව ජීවත් වන විශාල පිරිසක් සිටින බවද නිරීක්ෂණය විය. | කාර්යාල බල ප්‍රදේශයේ ගැටළු හැකිතාක් අවම කිරිමට කටයුතු කර ඇති අතර කොවිඩ් වසංගත තත්වය නිසා මෙම තත්වය පාලනය අපහසු වී ඇත කෙසේ වෙතත් 2022 වර්ෂය තුල ගම්පහ දිස්ත්‍රික්කයේ පවතින ගැටළු හැකිතාක් කඩිනමින් විසදිමට පියවර ගන්නා බව දන්වමි. | අවම පහසුකම් නොමැතිව ජීවත්වන අය නගා සිටුවීම සදහා විශේෂ අවධානය යොමුකල යුතුය. |
| (ආ) | මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සිටින පවුල් 49,886 ක් අතුරින් අනවසර ඉඩම් වල පදිංචි පවුල් 97 ක්ද, තාවකාලික නිවාසවල ජීවත්වන පවුල් 407 ක්ද, වැසිකිලි පහසුකම් නොමැති පවුල් 745 ක්ද, පොදු ජල කරාම භාවිතා කරන පවුල් 676 ක්ද, විදුලිය නොමැති නිවාස 478 ක්ද, මාර්ග පහසුකම් නොමැති නිවාස 858 ක්ද වශයෙන් අවම පහසුකම්වත් නොමැතිව ජීවත්වන විශාල පිරිසක් සිටින බව නිරීක්ෂණය විය. | - එම - | - එම - |
| (ඇ) | 2021 දෙසැම්බර් 23 සිට දෙසැම්බර් 31දක්වා කාළය තුල ලියන ලද රු.1,183,234 ක් වටිනා චෙක්පත් 7 ක් මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ස්ථානයේවිද්‍යාතා මධ්‍ය හා තාක්ෂණ නිලධාරීන් අත රදවා ගෙන විද්‍යා තිබුණු අතර 2022 පෙබරවාරි 02 දින වන විට ද චෙක්පත්වලට අදාළව භාණ්ඩ ලැබී නොතිබුණි. | අදාල භාණ්ඩ ලබාගෙන චෙක්පත් නිදහස් කිරිමට කටයුතු කරන ලෙස දන්වා ඇත. | භාණ්ඩ ලැබීමෙන් පසුව පමණක් චෙක්පත් ලිවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2016 ජනවාරි 12 දිනැති අංක 1/2016 දරන සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශයේ චක්‍රලේඛ යේ හි 7.3 වගන්තිය ප්‍රකාරව සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දින වන විට පෝෂ්‍ය පුරවැසි දීමනා ප්‍රතිලාභීන් පිළිබඳව නැවත සමීක්ෂණයක් කළ යුතු වුවද මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරි වසම් 32 කට අදාළව සමීක්ෂණය සිදු කර නොතිබුණි. | අදාල චක්‍රලේඛ ප්‍රකාරව සමීක්ෂණ කටයුතු සිදු කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කර ඇත . | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළයුතු බව. |
| (ඉ) | 2021 දෙසැම්බර් 21 දිනැති අංක 1/2016 දරන ඉඩම් අමාත්‍යාංශ සහකාර අධ්‍යක්ෂක ගේ අංක L/3/J95/HW/11 දරන ලිපිය ප්‍රකාරව පැලියගොඩ පුත්තලම මාර්ගය පුළුල් කිරීමේදී අත්පත් කර ගත් ඉඩම් කැබලි 406 කට අදාළව වන්දි හා ඉඩම් කැබලි 518 කට අදාළව පොලී ගෙවා නොමැති අතර 44 වගන්තිය යටතේ පැවරීමේ සහතික නිකුත් කර නොතිබුණි. ඊට අදාළව උපගොනු 1221 න් 861 ක්ම කාර්යාලය තුළ නොමැති බව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දන්වා තිබුණි. | මේ සඳහා ප්‍රමාණවත් තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව නොතිබීම නිසා මාර්ග සංවර්ධන අධිකාරිය සතුව තොරතුරු තිබේද යන්න විමසා ඇතත් මෙතෙක් පිළිතුරුක් ලැබී නොමැත. | ලිපිගොණු යාවත්කාලීනව පවත්වා ගනිමින් වන්දි ගෙවීම් කඩිනම් කළයුතු බව. |

## 4. තිරසාර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමේ ප්‍රගතිය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධන අරමුණු 10 ක් හඳුනා ගෙන තිබූ අතර ඒ සඳහා ඉලක්ක 20 ක් හඳුනා ගෙන තිබුණි. සමාලෝචන වර්ෂය අවසාන වන විට එම ඉලක්ක ඉටුකර ගැනීමේ ප්‍රගතිය අපේක්ෂිත ඉලක්ක 18 ක් සඳහා සියයට 0 සිට සියයට 49 ක් හා අපේක්ෂිත ඉලක්ක 02 ක් සඳහා සියයට 50 සිට සියයට 74 අතර ප්‍රමාණයක පැවැතුණි. | රටේ පැවති **covid 19** වසංගත රෝගී පාලන ක්‍රමවේද හේතුවෙන් වරින් වර රට වසාදැමීම.රාජ්‍ය ආයතන වසා දැමීම, වත්‍රිය ක්‍රමවේදයන්ට නිලධාරින් කැඳවීම,ආදී හේතු නිසා අපේක්ෂිත ඉලක්ක කරා යාමට නොහැකිවීම. | සැලසුම් කල පරිදි සපුරා ගත යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ)** 2021 දෙසැම්බර් 31 දින වන විට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා අනුමත සේවකයන් 3,457 ක් වූ අතර තත්‍ය කාර්යය මණ්ඩලය 3,169 ක් වූයෙන් පුරප්පාඩු 288 ක් විය. | සෑම මසකම 15 දින හා 30 දින දිස්ත්‍රික්කයේ පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවි මගින් (misco,moha) යාවත්කාලීන කරනු ලැබේ. | කාර්යක්ෂමව පවත්වාගෙන යාමට අවශ්‍ය සේවක ප්‍රමාණය බඳවා ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| **(ආ)** ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 සඳහා අනුමත ග්‍රාම නිලධාරීන් 1177 කින් ග්‍රාම නිලධාරී තනතුරු 201 ක් 2021දෙසැම්බර් 31 දින වන විටත් පුරප්පාඩුව පැවතිණි. | ග්‍රාම නිලධාරි බඳවාගැනීම් 2018 වර්ෂයෙන් පසු සිදු කර නොමැතිවීම නිසා පුරප්පාඩු සම්පූර්ණ කර ගැනිමට බාධාවක් වී ඇත. | පුරප්පාඩු පුරවාගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඇ)** 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව එක් සේවා ස්ථානයක වසර 05 කට වඩා වැඩි සේවා කාලයක් සපුරා ඇති නිලධාරීන් ස්ථාන මාරුවීම් සඳහා යටත් විය යුතු වුවද මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වසර 6 සිට 8 දක්වා කාලයක් සේවයේ නියුතු නිලධාරින් 134 දෙනෙකුද මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වසර 6 සිට 9 දක්වා කාලයක් සේවයේ නියුතු නිලධාරින් 09 ක්ද ඇති බව නිරීක්ෂණය විය. මෙම සේවාවන් සඳහා ස්ථාන මාරු ක්‍රමවේද ක්‍රියාත්මක වී තිබුණද මෙම නිලධාරීන්ට මෙලෙස එකම සේවා ස්ථානයක රැඳී සිටීමට ඉඩ ලබා දී තිබුණි. | සංවර්ධන නිලධාරින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් පිටතට ස්ථාන මාරු නොකිරීම,ස්ථාන මාරු කරන ලද නිලධාරින් අභියාචනා ඉදිරිපත් කර ස්ථාන මාරු අවලංගු කර ගැනිම, අනුප්‍රාප්තිකයා නොපැමිණිම මත නිලධාරින් ස්ථාන මාරු ක්‍රියාත්මක නොවීම නිසා නිලධාරින් එම ස්ථානයේම සේවයේ යෙදි සිටී. | සෑම නිලධාරියකුටම විවිධ කාර්යාලයන්හි සේවය කිරීමට හැකිවන පරිදි චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව ස්ථාන මාරු ක්‍රියාත්මක කළ යුතුය. |